**බණ්ඩාරවෙල මහා නගර සභාව - 2022**

**-----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 ව්‍යාවනය කළ මතය

බණ්ඩාරවෙල මහා නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 වන අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය කිරීමේ පදනම කොටසේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 ව්‍යාවනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ව්‍යාවනය කළ මතයක් පළ කරනු ලැබේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම ඡේදයේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සපයා ගැනීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ ලැබී තිබුණු රු.16,000,000 ක් මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනයේ ප්‍රාග්ධන ආධාර ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය යටතේ ලැබෙන මුදල් ප්‍රාග්ධන ආධාර ලෙස ගිණුම්ගත කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ බිල්කිරීමකට අදාළ නොවන තොග එළවළු කඩ වලින් එකවර අයකිරීම රු.198,077,523 ක් වැඩියෙන් මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනයට ගෙන තිබුණි. | රු.198,077,523 ක මුදල මූල්‍ය ප්‍රකාශනයට ගෙන ඇත, තවද මෙම මුදල හිඟ හිටි ආදායම් උප ලේඛනයට ඇතුළත් කර ඇති බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ඇ) | මහා නගර සභා ගිණුම් ආකෘතිය අනුව ඉඩම් හා ගොඩනැඟිලි, දේපළ පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත නොකළ යුතු වුවද, රු.3,606,600,414 ක් වූ ඉඩම් හා ගොඩනැඟිලි, දේපළ පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේදී නිවැරදි කරන බව. | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තාවකාලික ඉන්ධන ගබඩාවේ රු.137,430 ක් වූ ඉන්ධන තොගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඉ) | දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ශේෂ සනාථනවලින් සාක්ෂි ඉදිරිපත් වූ රු.4,403,970 ක ණය මුදල සහ ඊට අදාළ පොළිය රු.3,618,597 ක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඊ) | ඉකුත් වර්ෂයේ ශේෂ නිවැරදි කිරීම් ලෙස දක්වමින් වත්කම් ගිණුම් 02 ක සහ වගකීම් ගිණුමකට අදාළව එකතු වටිනාකම රු.22,632,989 ක් සමුච්චිත අරමුදලට ගලපා තිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඩ) | ඉකුත් වර්ෂයට අදාළ ණයහිමියන් අඩුවෙන් ගිණුම්ගත කිරීමේ වරද නිවැරදි කිරීම සඳහා රු.1,808,345 ක් සමුච්චිත අරමුදල් ගිණුමට හර කර තිබුණද ලෙජරයේ ණය හිමි ගිණුමට බැර කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඪ) | සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ අනුව ඉවත් කර තිබුණු ගණක යන්ත්‍ර, ජී අයි බට, තිරරෙදි සහ ට්‍රැක්ටර් රථය ආදී වත්කම් වලට අදාළ රු.627,560 ක් ප්‍රාග්ධන යෙදවුමට ආදායමින් දායකවීමේ ගිණුමට හර කර නොතිබුණි. | යන්ත්‍රෝපකරණ රු.298,666 ක්, මෝටර් රථ හා කරත්ත රු.182,244 ක්, ලී බඩු උපකරණ රු.146,650 ක් වශයෙන් නිවැරදි ශේෂ ගිණුම්ගත කර ඇති බව. | -එම- |
| (ඵ) | ඉකුත් වර්ෂයේදී ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අන්තර්ග්‍රහණය කර තිබුණු නිලධාරීන් 06 දෙනෙකුගෙන් අයකර ගත යුතු රු.703,896 ක සේවක ණය ගිණුම්ගත කර නොතිබුණි. | මේ වන විට අයකරගතයුතු ශේෂය රු.703,896 ක් විය යුතුය. එය 2023 වර්ෂයේ නිවැරදිව ගිණුම්ගත කරන බව. | -එම- |
| (ඒ) | සමාලෝචිත වර්ෂයේදී කොන්ත්‍රාත් ඇප තැන්පතු වටිනාකම උපලේඛනය අනුව රු.5,620,431 ක් වුවද, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.56,204,301 ක් ලෙස රු.50,583,870 ක් වැඩියෙන් සටහන් කර ගිණුම තුලනය කර තිබුණි. | පොදු තැන්පත් ලෙජරය පරීක්ෂා කර උප ලේඛනය නිවැරදි කරන බව. | -එම- |
| (ඔ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බස් නැවතුම්පොළ කඩ කාමර 02 කින් කලින් ලද ආදායම් රු.12,177,475 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වැඩියෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂයේදී නිවැරදි කරන බව. | -එම- |
| (ඕ) | සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ රු.207,788 ක් සහ මුද්දර ගාස්තු ආදායම රු.5,060,749 ක් ලෙස එකතුව රු.5,268,537 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනයට ගෙන තිබුණි. | 2023 වර්ෂයේ උපචිත පදනම මත ගණනය කර ගිණුම්ගත කරන බව. | -එම- |
| (ක) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මාර්ග, කාණු පද්ධති, පැති බැම් සහ නිල නිවාස අලුත්වැඩියා කර්මාන්ත 23 කට අදාළ බිල්පත් ඉදිරිපත් නොකළ එකතුව රු.36,407,093 ක් සඳහා ණයහිමි වෙන් කර තිබුණි. | ඉදිරියේදී බිල් කර ඇති බිල්පත්වල වටිනාකම පමණක් ණය හිමි ලෙස ගිණුම්ගත කරන බව. | -එම- |
| (ග) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයහිමියන් ගිණුම්ගත කිරීමේදී ඇතිවී තිබුණු ද්විගණන දෝෂය හේතුවෙන් මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ රු.936,000 ක් ජංගම වගකීම් වැඩියෙන් දැක්වේ. | 2023 වර්ෂයේදී නිවැරදි කරන බව. | -එම- |
| (ජ) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ සහ සභා අරමුදලින් මිලදී ගෙන තිබුණු එකතුව රු.10,634,172 ක් වූ වත්කම් ඒකක 144 ක් ජංගම නොවන වත්කම් ලෙස ප්‍රාග්ධනිත කර නොතිබුණි. | දැනට ඉන්වෙන්ට්‍රියේ ඇතුළත් කර ඇති අතර 2023 වර්ෂයේදී ගිණුම් මඟින් නිවැරදි කරන බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ට) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොලිය රු.969,863 ක් මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | 2023 වර්ෂයේදී නිවැරදි කරන බව. | -එම- |
| (ඩ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ ලෙස මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ රු.6,754,888 ක් වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ණ) | සමාලෝචිත වර්ෂයේදී කොන්ත්‍රාත්කරුවෙකුට ගෙවා තිබුණු රු.2,869,416 ක කර්මාන්ත අත්තිකාරම්, තැන්පතු ලෙස සටහන් කර තිබුණි. | -එම- | -එම- |
| (ත) | සමාලෝචිත වර්ෂයේදී උපලබ්ධි කර තිබුණු රු.5,000,000 ක ස්ථාවර තැන්පතු සහ සභාවේ බැංකු ගිණුම් අතර රු.4,000,000 ක් මුදල් මාරු කිරීම වැරදි ලෙස තැන්පතු ශීර්ෂයට සටහන් කිරීම හේතුවෙන් ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂය රු.9.000,000 කින් වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ද) | සමාලෝචිත වර්ෂයේදී ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් සංවර්ධන කටයුතු වලදී මාර්ග 05 ක සිදුවූ හානි අලුත්වැඩියා කිරීම සඳහා සභාවට ගෙවා තිබුණු රු.7,924,153 ක් පොදු තැන්පත් වශයෙන් ගිණුම්ගත කර තිබුණ අතර දැනට අදාළ අලාභ ප්‍රතිපූර්ණය කිරීම සහා අරමුදලින් ගෙවා තිබුණි. | සහා අරමුදලින් ගෙවා ඇති මුදල ආදායමට ගැනීමට කටයුතු කරන බව. | -එම- |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් විෂයයන් 06කට අදාළව මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනය අනුව ශේෂ එකතුව හා උපලේඛන අනුව ශේෂ එකතුව අතර රු.2,198,970 ක වෙනසක් විය. | පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී පොදු ලෙජරයේ ලෙජර් ගිණුම් 07 ක ආරම්භක ශේෂ සටහන් කිරීමේදී එකතුව රු. 148,921,998 ක වෙනසක් නිරීක්ෂණය විය. | පොදු ලේජරයේ ආරම්භක ශේෂයට ගලපා නොතිබුණත් උප ගිණුම් හරහා අවසාන ගිණුමට ශේෂය නිවැරදිව යොදවා ඇති බව. | පොදු ලෙජරය පිළියෙල කර නිවැරදි ශේෂ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පොදු ලෙජරයක් විධිමත්ව පවත්වා නොතිබීම හේතුවෙන් දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු මූල්‍ය ප්‍රකාශනයන්හි දැක්වෙන වටිනාකම් පිළිබඳව සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය තුලනය වීම සම්බන්ධයෙන් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | 2023 වර්ෂයේ නිවැරදි පොදු ලෙජරයක් පවත්වා ගන්නා බව. | පොදු ලෙජරය විධිමත්ව පවත්වා ගත යුතු අතර, මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය ආරම්භයේ සහ අවසානයේ වෙනත් හිඟහිටි ආදායම්, කලින් ලද ආදායම් සහ විවිධ ණයහිමි වටිනාකම් ලෙජරයේ විවිධ ආදායම් සහ විවිධ වියදම් ගිණුම්වල සටහන් කිරීම් විධිමත්ව සිදුකර නොතිබීම හේතුවෙන් වටිනාකම රු.716,006,962 ක් වූ ලෙජයේ ගණුදෙනු සටහන් සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | 2023 වර්ෂයේදී නිවැරදි කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104 (4) වගන්තිය | 2015 අප්‍රේල් 09 දින සිදුව තිබුණු සභාවට අයත් කැබ්රථ අනතුර සම්බන්ධයෙන් පූර්ණ වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු පසුව ලබා දීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක 2/මු/1 හා 2005 මාර්තු 24 දිනැති ලිපිය අනුව | සේවක ඇප තැබිය යුතු නිලධාරීන් 28 ක් ඇප තැන්පත් කර නොතිබුණි. | මෙම 28 දෙනාගෙන් 15 දෙනෙකු ඇප තැන්පත් කර ඇති බවත් අනෙකුත් 13 දෙනාගේ ඇප තැන්පත් කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,808,000 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.39,020,666 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

මූල්‍යමය ගණුදෙනු සම්බන්ධයෙන් පැහැදිලිව සහ නිවැරදිව පොත්පත් හා ලේඛන පවත්වාගෙන යාම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ මූලික වගකීමක් වුවද, සමාලෝචිත වර්ෂයට අදාළව මහා නගර සභාවේ මූල්‍ය ගණුදෙනු වාර්තා කිරීම් සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොදු ලෙජරයේ මුදල් ගිණුමේ ශේෂය රු.118,890,715 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.7,011,135 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.111,879,580 ක වෙනසක් නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නැත. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය බැංකුවක ඉතුරුම් ගිණුමක රු.6,754,888 ක ශේෂයක් මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ දක්වා තිබුණද, ඉතිරි කිරීමේ පාස් පොතේ ශේෂය රු.306,555 ක් විය. | දෛනික මුදල් සාරාංශ පොතේ ශේෂය සහ බැංකු සැසඳුමේ ශේෂය නිවැරදි වන අතර දෙසැම්බර් 31 දිනට යොදන ලද අවසාන ශේෂය රු.701,135 නිවැරදි ශේෂය බව දන්වමි. තවද 2023 වර්ෂයේ ගිණුම්වල මුදල් හා මුදල් සමාන දෑ යටතේ නිවැරදි ශේෂය යෙදීමට කටයුතු කරන බව. | -එම- |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

නගරාධිපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 18,885,000 | 18,284,746 | 14,907,314 | 3,377,432 | 35,276,000 | 35,276,000 | 16,404,587 | 18,871,413 |
| (ii) | කුලී | 44,919,768 | 46,427,854 | 43,939,750 | 2,488,104 | 11,795,000 | 11,795,000 | 57,599,065 | (45,804,065) |
| (iii) | බලපත්‍ර ගාස්තු | 6,605,000 | 6,805,573 | 6,805,573 | 0 | 21,959,000 | 21,959,000 | 8,622,584 | 13,336,416 |
| (iv) | වෙනත් ආදායම් | 52,012,000 | 60,861,677 | 48,189,543 | 12,672,134 | 233,349,691 | 233,349,691 | 45,095,787 | 188,253,904 |
| | එකතුව | 122,421,768 | 132,379,850 | 113,842,180 | 18,537,670 | 302,379,691 | 302,379,691 | 127,722,023 | 174,657,668 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර 02 කට අධික කාලයක සිට පැවත එන හිඟ හිටි වරිපනම් බදු රු.11,352,835 ක් කඩ කුලී රු.1,640,816 ක්, තානායම් කළමනාකරණ ගාස්තු රු.13,294,588 ක්, පොළ බදු රු. 1,565,697 ක්, ටෙන්ඩර් කඩ කුලී රු.3,885,207 ක්, පොදු වැසිකිලි ගාස්තු රු.771,862 ක් සහ වෙනත් ආදායම් රු.80,374 ක් සමාලෝචිත වර්ෂයේදීද අය කරගෙන නොතිබුණි. | හිඟ හිටි ආදායම් ඉදිරියේදී අය කර ගැනීමට පියවර ගන්නා බව. | හිඟ හිටි ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |

### 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ වූ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය,පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභාව කළමඩුගස්තැන්න, බණ්ඩාරවෙල යන ස්ථානයේ පවත්වාගෙන යන ඝණ අපද්‍රව්‍ය කළමණාකරන මධ්‍යස්ථාන භූමියේ දීර්ඝකාලීනව නොදිරන කසළ ගොඩ ගසා තිබුණි. | මේ සම්බන්ධව ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදු කරන බව. | පරිසර ආරක්ෂණ බලපත්‍රයේ කොන්දේසි අනුව කටයුතු කළ යුතුය. |

### 3.2 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩ කාමර සඳහා එකවර අය කිරීම් ලැබීම් ලෙස රු.77,065,544 ක් සභා අරමුදලට ලැබී තිබුණි. මෙම ලැබීම් තුළ රු.71,822,477 ක් යෝජිත විශාඛා පාර තොග එළවළු පොළ සංකීර්ණයේ කඩ කාමර සඳහා වූ අතර, 2018 වර්ෂයට පෙර සිටම එම වෙළඳ මධ්‍යස්ථානයේ කඩ කාමර සඳහා එක්වර මුදල් අයකිරීම් සිදුකර තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වාද වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි. එසේ වුවද එකවර ලැබුණු මුදල් සභාවට වගකීමක් ලෙස තැන්පතු ගිණුම්වල රඳවාගෙන නොතිබුණු අතර, මහා නගර සභාව විසින් බාහිර පාර්ශවයන්ගෙන් ලබාගත් මුදල් අරමුණුගත කාර්යයන්ගෙන් බැහැර කාර්යය සඳහා වැය කර තිබුණි. | ඉදිරියේදී මේ සම්බන්ධව කටයුතු කරන බව. | අරමුණුගත කාර්යයට පමණක් අරමුදල් යෙදවිය යුතුය. |

### 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් කැබ් රථයක් 2015 අප්‍රේල් 09 දින අනතුරට ලක්ව තිබුණු අතර අනතුරෙන් සිදුවූ අලාභය සඳහා වන්දි ලබා ගැනීමට සහ කැබ් රථය අළුත්වැඩියා කර නැවත ප්‍රයෝජනයට ගැනීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අනුමත අලුත්වැඩියා ආයතනයක් වෙත රැගෙන ගොස් පරීක්ෂා කිරීමෙන් පසු කැබ් රථයේ අලුත්වැඩියා කටයුතු සඳහා පුද්ගලික ආයතනයක ගාල්කර තිබුණු කාලය තුළ වර්ග 27කට අයත් අමතර කොටස් හා උපාංග අස්ථානගත වී තිබුණු බව 2022 ඔක්තෝබර් 31 දින මහා නගර සභාව දැනුවත් කර තිබුණු නමුත්,ඒ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වාහන අලුත්වැඩියා කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | අලුත්වැඩියාවන් කඩිනමින් නිමකර උපාංග අස්ථානගතවීම් සම්බන්ධයෙන් පරීක්ෂණ ආරම්භ කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී මහා නගර සභාව විසින් හඳුනාගෙන තිබුණු අනවසර ඉදිකිරීම් 37 ක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අධීක්ෂණ කටයුතුවල නිරත කාර්මික නිළධාරී විසින් එම ස්ථානයේදීම අවශ්‍ය උපදෙස් ලබාදී ඇත. එසේ කටයුතු නොකරන පුද්ගලයන්ට ඉදිරියේදී නඩු පවරන බව. | කඩිනමින් ක්‍රියාමාර්ග ගෙන නිරවුල් කළ යුතුය. |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බණ්ඩාරවෙල මහා නගර සභාවට සතු තොග හා සිල්ලර පොළෙහි 2020 වර්ෂයට ගාස්තු අයකිරීමේ අයිතිය බදුදීම සඳහා ලංසුකරුවන් කැඳවීමේදී 2019 වර්ෂයේ අවසාන දින 10 තෙක් ප්‍රමාද කර පුවත්පත් දැන්වීම් පළකර තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 ඡේදයේ දැක්වෙන විධිවිධානවලට අනුකූල නොවන පරිදි ලංසු කැඳවීම දින 06 කට සීමා කර තිබුණි. එයින්ද දින 03 කට පසු ලංසු පෝරම නිකුත් කිරීම හේතුවෙන් ලංසුකරුවන් සපුරාලිය යුතු බවට නියම කරන ලද විශේෂ කොන්දේසි සපුරා ගැනීමට ප්‍රමාණවත් කාලයක් නොතිබුණු අතර, ඒ සඳහා සාධාරණ කාලයක් ලබාදෙන ලෙස ඉල්ලීම් කර තිබුණද ඊට ප්‍රසම්පාදන කමිටුවේ අවධානය යොමු කර නොතිබුණි.ඒ අනුව ලංසුකරුවන්ට ඔවුන්ගේ වත්කම් හා හිමිකම් සහතිකයක් ඉදිරිපත් කිරීමට නොහැකි වීම වැනි ඉතාම සුළු අඩුපාඩුවක් මත ඉහළම ලංසු ඉදිරිපත් කළ ලංසුකරුන්ගේ ලංසු ප්‍රතික්ෂේප කිරීම හා අඩුම ලංසු ඉදිරිපත් කළ ලංසුකරුවන්ගේ ලංසු පිළිගැනීමෙන් බණ්ඩාරවෙල මහා නගර සභාවට රු.8,290,000 ක මූල්‍යමය පාඩුවක් සිදුවී තිබුණි. | ප්‍රසම්පාදනය කර බදු දී ඇති බව. | විධිමත්ව ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර දේපළ බදුදිය යුතුය. |